# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2006/41 - 2017 පෙබරවාරි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2017 පෙබරවාරි මස 17 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.08.24 දිනැති අංක 1981/46 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් අර්තාපල් (සංයෝජිත වර්ගීකරණ අංක 0701.90), 2016.08.19 දිනැති අංක 1980/37 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් බොම්බයි ළූණු (සංයෝජිත වර්ගීකරණ අංක 0703.10.20) සහ 2016.09.29 දිනැති අංක 1986/55 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පරිප්පු (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0713.40.11, 0713.40.12, 0713.40.21, 0713.40.22) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2017 පෙබරවාරි මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2017 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 01. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 02. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 03. | 07.13 | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 10.00 |
| | | 0713.40.12 | පියළිකළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 10.00 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 15.00 |

03 - 306


1A - PG 3421 — 532 (2017/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*